# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1942/25 - 2015 නොවැම්බර් මස 27 වැනි සිකුරාදා - 2015.11.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*.: 2/2/1/101/(11)/ගොනුව.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩම්/පරවශ්‍යතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුවේ 230සී ගල්තොටමුල්ල ගමේ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0243 ක් වූ ඉඩම් කොටස් සඳහා සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගම්පහ මිනුම් අධිකාරි විසින් මැන සකස් කළ මු. පි. ගම්. 3954 දරන මුලික පිඹුරේ විස්තර කෙරෙන පහත සඳහන් ඉඩම් කොටස්;

**කැබලි අංක 1**
ඉඩමේ නම: හැඩවකගහලන්ද; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවරුදු 40ක පමණ වයසැති පොල් ගස් 03ක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ආරච්චි අප්පුහාමිලාගේ දොන් කරුණාපාල මයා, ගල්තොටමුල්ල, යක්කල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0069.

**කැබලි අංක 2**
ඉඩමේ නම: හැඩවකගහලන්ද; ඉඩමේ විස්තරය: ගෙවත්ත, අවරුදු 30ක පමණ වයසැති පොල් ගස් 03ක් ද, අවුරුදු 3ක් පමණ වයසැති පොල් ගස් 1ක්ද, අවුරුදු 20ක පමණ වයසැති පුවක් ගස් 14ක්, අවුරුදු 30ක් පමණ වයසැති කළුවර ගස් 1ක්ද, අවුරුදු 10ක පමණ වයසැති වල්ලපට්ට ගස් 2ක්ද පැරණි වැසිකිළියක්ද ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: මදුරප්පෙරුම ආරච්චිලාගේ ජයරත්න මයා, අංක 90, ගල්තොටමුල්ල, යක්කල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0135.

**කැබලි අංක 3**
ඉඩමේ නම: ගලකුඹුර; ඉඩමේ විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0039.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්/පරවශ්‍යතාවයට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ජනවාරි මස 20 වැනි දින පෙ. ව. 10.00ට ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2016 ජනවාරි මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු හා අනෙකුත් ලියවිලි ද පරීක්ෂණ දිනයේදී ඉදිරිපත් කළ යුතුයි.

සී. පී. ඩබ්. ගුණතිලක,
ප්‍රාදේශීය ලේකම්,
ගම්පහ.

2015 ඔක්තෝබර් මස 23 වැනි දින,
ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 439

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*අංකය:* දො/ඉ/1/අත්/110.

*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය :* 4/3/9/2012/ WS/384.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 800සී බටහිර දොඩන්ගොඩ/දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මැනුම්පති විසින් පිළියෙල කර ඇති ක/4529 හා 2015.10.19 දිනැති මූලික පිඹුරේ විස්තර කෙරෙන පහත සඳහන් ඉඩම් කැබලි.

**කැබලි අංක 1**

ඉඩමේ නම: සිල්වඩේල් වත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන්නා: දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0767.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015 දෙසැම්බර් මස 16 වැනි දින පෙ. ව. 10.30ට දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2015 දෙසැම්බර් 09 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/ පරවශතාව ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

එච්. ඩබ්. ටී. ආර්. වෙත්තසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
දොඩන්ගොඩ.

2015 නොවැම්බර් මස 19 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

12 - 440

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.